# කරුණු සතකින් යුත් භික්ෂුව සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය මනාප වෙයි

## දෙවැනි පියභික්ඛු සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 4 - පිටු අංක 280 - 281)

කරුණු සතකින් යුත් භික්ෂුව සබ්‍රහ්මචාරීන් (එකට බ්‍රහ්මචරියාවේ හැසිරෙන්නා වූ) වහන්සේලාට ප්‍රිය වෙයි. මනාප වෙයි. ගෞරව කටයුතු වෙයි.

**කවර සතකින් ද යත්;**

මේ ශාසනයේ භික්ෂුව,

1. ලාභ කැමති නොවෙයි.
2. ගරු සත්කාර කැමති නොවෙයි.
3. යසස් ලැබීමට කැමති නොවෙයි.
4. පවට ලජ්ජා ඇති වෙයි.
5. පවට බිය ඇති වෙයි.
6. ඉරිසියා නැත්තේ ද වෙයි.
7. මසුරු නො වූයේ ද වෙයි.

මේ කරුණු සතෙන් යුතු භික්ෂුව සබ්‍රහ්චාරීන් වහන්සේලාට ප්‍රිය වෙයි. මනාප වෙයි. ගෞරව කටයුතු වෙයි.